24 ඒකකය - සරල රේඛීය තල රූප නිර්මාණය(3)

- **සවිධි ෂඩස්‍රයක් නිර්මාණය කිරීම**

පියවර 1 - අරය 3 cm ක් වූ වෘත්තයක් කවකටුව භාවිතයෙන් නිර්මාණය කරන්න.

පියවර 2 - එම වෘත්තය මත A නම් ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.



පියවර 3 - කවකටුවේ සැකැස්ම වෙනස් නොකර එහි තුඩ A ලක්ෂ්‍යය මත තබා වෘත්තය ඡේදනය වන පරිදි කුඩා චාපයක් ඇඳ ඡේදන ලක්ෂ්‍යය B ලෙස නම් කරන්න.



පියවර 4 - ඉහත ආකාරයට කවකටුව වෘත්තය මත Bහි තබා C ලක්ෂ්‍යය ද, Cහි තබා D ලක්ෂ්‍යය ද, Dහි තබා E ලක්ෂ්‍යය ද, Eහි තබා F ලක්ෂ්‍යය ද, ලකුණු කරන්න.



පියවර 5 - A, B, C, D, E සහ F ලක්ෂ්‍ය පිළිවෙළට යා කරන්න.



- පහත දැක්වෙන දිග සහිත පාද ඇති සමපාද ත්‍රිකෝණ නිර්මාණය කරන්න.

i 5 cm ii 2 cm iii 3.5 cm iv 6 cm v 4 cm